# ආගමන සමයේ දෙවන සතිය
# අඟහරුවාදා

**පළමුවන කියැවීම** යෙසායා 40: 1–11

යෙසායා දිවැසිවරායාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*ස්වාමින් වහන්සේ සිය සෙනඟ සනසන සේක*

"සනසන්න, මාගේ සෙනඟ සනසන්නැ" යි ඔබේ දෙවිඳාණෝ වදාරණ සේක. කරුණාවෙන් ජෙරුසලම් වැසියන්ට කතා කරන්න. හඬ නගා ඔවුන්ට මෙසේ කියන්න. ඔවුන්ගේ වහල්කමේ කාලය දැන් ඉවර වී ඇත. පව් කමාව ඔවුන්ට ලැබී ඇත. සියලු පව්වලට දඬුවම දෙගුණය බැගින් සමිඳුන්ගේ හස්තයෙන් ම ඔවුන්ට ලැබී ඇත". මෙසේ කියන හඬට සවන් දෙන්න. "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළි කරන්න. පාළුකරයෙහි අපේ දෙවිඳුන් හට මහ පාරක් සාදන්න. සියලු මිටියාවත් පුරවනු ලැබන්නේ ය. සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේ ය. සියලු හෙල් සමතලා කරනු ලබන්නේ ය. රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය. සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව් වන්නේ ය. සකල මිනිස් වර්ගයා එය නරඹන්නෝ ය. මෙසේ වදාළේ සමිඳාණෝම ය.

"පණිවුඩයක් ප්‍රකාශ කරන්නැ" යි හඬක් කීය. "කුමන පණිවුඩයක් ප්‍රකාශ කරම්දැ" යි මම ඇසිමි. මිනිස් වර්ගයා තණකොළ හා සමාන වෙති. ඔහුගේ සුන්දරතාවය වන මල් මෙන් පහව් යයි. සමිඳුන්ගේ හුස්ම වැදුණ විට තණකොළ වියළී යයි. මල් පර වෙයි. එහෙත් අපේ දෙවිඳුන්ගේ වචනය සදහට ම පවතියි. "සියොන්ට සුභ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, උස් කන්දට නගින්න. සියොන්ට සුබ ආරංචිය දක්වන්න. ජෙරුසලෙමට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, හඬ නගා ප්‍රකාශ කරන්න. බිය නොවී උස් හඬින්, "ඔබේ දෙවිඳාණන් වඩින සේකැ" යි ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න.

සමිඳුන් වන දෙවිඳණෝ බලපරාක්‍රමයෙන් වඩින සේක. වික්‍රමයෙන් පාලනය කරන්නට වඩින සේක. ත්‍යාගයන් එතුමාණෝ තමන් සමඟ ගෙන එන සේක. තම සෙනගට විපාකයක් ප්‍රදානය කරන සේක. එඬේරෙකු සේ එතුමාණෝ තම රැළ පෝෂණය කරන සේක. දැතින් බැටළු පැටවුන් වඩා ගෙන, ළයෙහි උන් හොවා ගෙන යන සේක. කිරි දෙන බැටළු දෙනුන්ට මඟ පෙන්වන සේක.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 96: 1–3, 10–13 |
|---|---|

පිළිතුර: මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ බලපරාක්‍රමයෙන් වඩින සේක

ගීය: සමිඳුන් හට නව ගීයක් ගයන්න.
පොළො වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න.
සමිඳුන් හට ගී ගයා එතුමන්ගේ නාමයට ආසිරි පතන්න.
එතුමන්ගේ ගැළවීමේ සුබාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්න.

විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න.
ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.
විජාතීන් අතර මෙසේ පවසන්න. “සමිඳාණෝ රජකම් කරන සේක.
නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත.
එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන් විනිශ්චය කරන සේක.

සග ලොව ප්‍රීති ප්‍රමෝද වේවා! නර ලොව තුටු පහටු වේවා!
සමුදුරත් එහි ඇති සියල්ලත් ගිගුරුම් දේවා!
කෙත් වතු සහ එහි ඇති සියල්ලන් ප්‍රීතිමත් වේවා!
එවිට වන රොදෙහි ගස් කොළන් ප්‍රීති නාද දෙන්නේ ය.

සමිඳාණන් මිහිතලය පාලනය කිරීමට වඩින විට ඒවා නද දෙන්නේ ය.
එතුමාණෝ ලෝ වැසියන් සාධාරණ ලෙස ද
අවංක ලෙස ද පාලනය කරන සේක.

| සුපුවත් ජය නද |
|---|

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, වඩිනු මැනව, පමා නොවනු මැනව.
ඔබේ සෙනඟගේ පව් වලට කමා වනු මැනව.
ආලේලූයා!

| සුවිශේෂය | මතෙව් 18 : 12–14 |
|---|---|

සුවිශේසක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*"එක්කෙනෙකුවත් විනාශ වීම පියාණන් වහන්සේගේ කැමැත්ත නොවේ"*

"ඔබ කුමක් සිතන්නහු ද? බැටළුවන් සියයක් ඇති යම් මිනිසෙක්, උන්ගෙන් එකෙකු මුළාව ගියොත්, ඉතිරි අනූ නව දෙනා කඳුකරයේ ඉන්න හැර, මුළාව ගිය එකා සොයා යන්නේ නැද්ද? සැබැවින් ම ඔබට කියමි, ඌ සම්බ වුනොත් මුළාව නොගිය අනූ නව දෙනා ගැන ප්‍රීති වෙනවාට වඩා ඌ ගැන ප්‍රීති වන්නේ ය. එසේ ම මේ බාලයන් එක්කෙනෙකු වත් විනාශ වීම ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගේ කැමැත්ත නොවේ."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචය මෙසේ ය.*